තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

இளைஞர் மற்றும் விளையாட்டு அமைச்சகம்

Ministry of Youth & Sports



2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT



තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

2021

වාර්ෂික

කාර්යසාධන වාර්තාව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

තරුණයන්ගේ අභිලාෂයන්
හඳුනාගෙන ඒවා මුදුන්පත්
කිරීම සඳහා නිශ්චිත සහ ස්ථිර
වැඩපිළිවෙලක් යටතේ විසඳුම් ලබා
දීමෙන් තෘප්තිමත් තරුණ පරපුරක්
බිහිකිරීම අපගේ අභිලාෂය වේ.

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

සම්පාදනය
සැලසුම් අංශය
ප්‍රකාශනය
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
+94 112 697 934 | info@mos.gov.lk
www. mos.gov.lk

අපේ වටිනාකම්

ක්‍රීඩාව ශ්‍රී ලංකා සංස්කෘතියේ හා සමාජයේ අනිවාර්ය අංගයක් බවට පත් කිරීම.

සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය, ශාරීරික යහපැවැත්ම සහ සෞඛ්‍යය පොහොසත් කිරීම සඳහා ක්‍රීඩාව යොදා ගැනීම.

දැනුම, ප්‍රවේශය සහ සෑම කෙනෙකුටම ක්‍රීඩාවට සහභාගී වී එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට අවස්ථාව ලබා දීම.

ක්‍රීඩාවේ සමස්ත සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් හා සුදුසු යටිතල පහසුකම් සැපයීම.

සෑම ශ්‍රී ලංකාවකටම ක්‍රීඩාවේ ප්‍රශස්ත හැකියාවන් ළඟා කර ගැනීමට සහාය වීම සහ සාර්ථක ක්‍රීඩා රටක් ලෙස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ශක්‍ය හා තිරසාර බව සහතික කිරීම.

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කර්මාන්තයක් සංවර්ධනය කිරීම සඳහා නව රැකියා උත්පාදනය කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වීම.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය උපයන්නෙකු ලෙස ක්‍රීඩා ක්ෂේත්‍රය යොදා ගැනීම.

ක්‍රීඩාව තුළින් සාමය හා වාර්ගික සමගිය ඇති කිරීම.

පෙලගැස්ම

1. තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	**06 - 43**
2. නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය	**44 - 67**
3. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය	**68 - 85**

අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
- 1.1 හැඳින්වීම
- 1.2 දැක්ම සහ මෙහෙවර
- 1.3 ප්‍රධාන කාර්යයන්
- 1.4 සංවිධාන සටහන
- 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු
- 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම
- 2.1 ප්‍රගතිය
- 2.2 ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
- 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය
- 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්
- 3.5 ආදායම් වැකතුකිරීමේ කාර්යසාධනය
- 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකරගැනීමේ කාර්යසාධනය
- 3.7 මු. රෙ. 208 ප්‍රකාරව ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
- 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය
- 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක
- 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය
- 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු
- 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම හා අභියෝග

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ
- 6.1 සේවක සංඛ්‍යාව කළමනාකරණය
- 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලබන ආකාරය
- 6.3 මානව සම්පත් සංවර්ධනය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

08 ඇමුණුම්

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

අභිමානවත් තුලිත පෞරුෂත්වයකින් යුත් ජවසම්පන්න තරුණ ප්‍රජාවක් හා ජවසම්පන්න, නීරෝගීමත් සහ විනයගරුක සමාජයක් බිහිකිරීම සඳහා ක්‍රියාශීලී පරපුරක් නිර්මාණය කිරීමට "සෞභාග යේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අනුකූලව අංක 2187/27 දරණ හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් තරුණ ප්‍රජාව හා ක්‍රීඩාව කේන්ද්‍ර කරගනිමින් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය ස්ථාපනය කරන ලදි.

ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.2 දැක්ම සහ මෙහෙවර

දැක්ම	ජවසම්පන්න තාරුණ්‍යය තුළින් තිරසර ලෙස සංවර්ධිත දේශයක්
මෙහෙවර	ජාතික ආර්ථිකයට සක්‍රීයව දායකත්වයක් ලබාදෙන තරුණ ප්‍රජාවක් බිහි කිරීම හා විනයගරුක, ක්‍රීඩාශීලී සමාජයක් ඇති කිරීම තුළින් ඒකාබද්ධ හා සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමට දායකවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

01. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අභිමානවත් ජව සම්පන්න තරුණ පරපුරක් බිහිකිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම.
02. නියමිත නීති හා අණපනත් වලට අනුකූලව තරුණ හා ක්‍රීඩා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
03. ජාතික අයවැය, රාජ්‍ය ආයෝජනය හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
04. ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතන වල විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.



සෞභාග්‍යයේ දැක්ම

ජවසම්පන්න තාරුණ්‍යය

"තරුණ ප්‍රජාවේ අභිලාෂයන් හඳුනාගෙන ඒවා මුදුන්පත් කිරීම සඳහා නිශ්චිත සහ ස්ථිර වැඩපිළිවෙලක් යටතේ විසදුම් ලබා දීමෙන් තෘප්තිමත් තරුණ පරපුරක් බිහි කිරීම"

ජවසම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවිබලය

"ජවසම්පන්න නීරෝගිමත් සහ විනයගරුක සමාජයක් බිහි කිරීම සඳහා ක්‍රීඩාශීලී පීවන රටාවකින් යුත් පරපුරක් නිර්මාණය කිරීම"

තිරසර සංවර්ධන ඉලක්ක (SDG)

අමාත්‍යාංශයට අදාළ සුවිශේෂී ප්‍රමුඛතා

ජවසම්පන්න තාරුණ්‍යය - "සෞභාග්‍යයේ දැක්ම"

- සියළු ආර්ථික ක්ෂේත්‍ර තුළ තරුණ ව්‍යාවසායකයන්ට උපරිම අවස්ථාව සහ අවශ්‍ය සියළු දිරිගැන්වීම්
- තරුණ ව්‍යාපාරික මාර්ගෝපදේශක මධ්‍යස්ථාන ක්‍රමයක්
- නවෝත්පාදන ව්‍යාපාර, නිෂ්පාදන සහ සේවාවන් සඳහා දිරිගැන්වීම හා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම ලබා දීමට පියවර
- ජාතික තරුණ අරමුදලක් ස්ථාපිත කර තරුණ ව්‍යවසායකයන්ට සඳහා සරල ණය ක්‍රමයක්
- තරුණ මානව සම්පත් දත්ත බැංකුවක්
- තරුණයන් සඳහා ස්මාර්ට් ජංගම දුරකතනයක්, ටැබ් එකක් හෝ ලැප්ටොප් පරිගණකයක් පහසු ක්‍රමයට ලබා ගැනීමේ ක්‍රමවේදයක්
- වෘත්තිය උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා රැකියාවක් කරන කාලයේ ගෙවීමට හැකි ආකාරයේ රු. මිලියන 0.8 සිට 1.4 දක්වා පොළී රහිත ණයක්

ජවසම්පන්න තාරුණ්‍යයට ක්‍රීඩාවේ සවිබලය - "සෞභාග්‍යයේ දැක්ම"

- පාසල්වල සතියට දින දෙකක් උදෑසන කාලපරිච්ඡේදය ශාරීරික ව්‍යායාම සඳහා වෙන් කිරීම
- ක්‍රීඩාවෙහි දක්ෂ සිසුන් සඳහා අවශ්‍ය පෝෂණය, පුහුණුව හා අනෙකුත් පහසුකම්
- ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා විශ්වවිද්‍යාලයක්
- වෘත්තිය ක්‍රීඩකයන්ට දේශීය හා විදේශීය අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ආධාර ක්‍රමයක් හඳුන්වා දීම හා ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයන්ට විදේශීය පුහුණුකරුවන්ගේ සේවය
- ආනයනික ක්‍රීඩා භාණ්ඩ, තාක්ෂණික මෙවලම් සහ පෝෂ්‍යජනක ආහාර සඳහා තීරුබදු සහන
- ජාත්‍යන්තර ක්‍රීඩා තරග වැඩසටහන් රට තුළ පැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යංශය යටතේ රාජ්‍ය අනුග්‍රහය

සුවිශේෂී ප්‍රමුඛතා - "196/27 අති විශේෂ ගැසට් පත්‍රය අනුව"

- රටේ අධ්‍යාපන, සමාජ, ආර්ථික දේශපාලන, සංස්කෘතික පෙරදැක්මට තරුණ සහභාගිත්වයේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම.
- ආර්ථික ක්ෂේත්‍රය තුළ තරුණ ව්‍යවසායකයන්ට උපරිම අවස්ථා සලසා දීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් හඳුන්වාදීම සඳහා ක්‍රමෝපායන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය,පෞද්ගලික, විදේශ රැකියා අවස්ථාවන් සඳහා ගැලපෙන, ශ්‍රී ලාංකික තරුණයන් නිවැරදිව හඳුනා ගැනීම පහසු කිරීම සඳහා තරුණ මානව සම්පත් දත්ත බැංකුවක් ආරම්භ කිරීම.
- ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාවන් සඳහා කුසලතා සංවර්ධනය පුළුල් කිරීම.
- ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය හා සංචාරක, නාගරික ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනඟන ක්‍රීඩා ආර්ථිකයක් බිහි කිරීම.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් තුළ විවිධ කුසලතාවයන් පිරි ක්‍රීඩා සහභාගිත්වයක් ඇති කර ජාත්‍යන්තර ක්‍රීඩක පරිසරයක් බිහි කිරීම.
- ක්‍රීඩා සමිති සංවිධානය හා ව්‍යාපාරික ප්‍රජාව ක්‍රීඩා තරඟාවලි (Events) සඳහා දිරි ගැන්වීම.
- සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීමට ශාරීරික ව්‍යායාම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට අදාළ මාර්ගෝපදේශ හා දිරි ගැන්වීම් ලබා දීම.

1.4 සංවිධාන සටහන

ඇමුණුම 01

1.5 අමාත්‍යංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
- මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

1.6 අමාත්‍යංශය යටතේ පවතින ආයතන

- ජාතික තරුණ සේවා සභාව
- ජාතික යොවුන් සේනාංකය
- නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
- ස්මාර්ට් ශ්‍රී ලංකා ආයතනය (අමප/21/0713/329) හා 2021.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙය මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී.

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1. සුවිශේෂී ජයග්‍රහණ

- **ජාත්‍යන්තරය ජයගත් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ**
  ජපානයේ ටෝකියෝ නුවර පැවැත් වූ පැරාලිම්පික් උළෙලේ හෙල්ල විසි කිරීම ඉසව්වට සහභාගී වූ දිනේෂ් ප්‍රියන්ත ශ්‍රී ලංකාව වෙනුවෙන් රන් පදක්කමක් දිනා ගන්නා ලදී.

  ජපානයේ ටෝකියෝ නුවර පැවැත් වූ පැරාලිම්පික් උළෙලේ හෙල්ල විසි කිරීම ඉසව්වට සහභාගී වූ දුලාන් කොඩිතුවක්කු ශ්‍රී ලංකාව වෙනුවෙන් ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදී.

- **ලෝක යොවුන් ශූරයා 2021 - චෙස්**
  2021 ඔන්ලයින් ෆිඩේ ලෝක යොවුන් චෙස් ශූරතාවලියේ අවසන් මහා තරඟයේදී ඇමරිකාවේ මේගන් අල්තියා පරාගුවා පරාජය කළ ශ්‍රී ලංකාවේ ඔෂිනි දේවින්යා ගුණවර්ධන 2021 - 10 න් පහළ බාලිකා ලෝක තරුණ චෙස් ශූරතාව දිනා ගෙන ඇත.

- **Cycling Sunday, Football Friday වැනි වැඩසටහන් ආරම්භ කර සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට යොමු කරවීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගන්නා ලදී.**

- **ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම**
  අංක අමප/21/0438/329/006 හා 2021 මාර්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජූලි 31 ජාතික ක්‍රීඩා දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

2.1.2 සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය කෙරෙහි බල පෑ අභියෝග

- ඉදිකිරීම් කොන්ත්‍රාත් - උපදේශන ආයතන ගැටළු
- ආනයන සීමා හේතුවෙන් ව්‍යවසායකයින් මුහුණ දෙන අමුද්‍රව්‍ය හා තාක්ෂණික උපකරණ සම්බන්ධ සීමා කිරීම්
- ව්‍යාපෘති හඳුනා ගැනීමේදී ගැටළු
- Covid වසංගත තත්ත්වය හේතුවෙන්;
  - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන අලෙවි හා මූල්‍ය ගැටළු
  - ක්‍රීඩා පුහුණු කටයුතු සඳහා අවකාශ නොමැති වීම හා තරඟාවලි නිසි පරිදි පැවැත්වීමට වූ අපහසුතා
  - කොවිඩ් මර්දන මධ්‍යස්ථාන ලෙස ජාතික යොවුන් සේනාංකය හා නායකත්ව පුහුණු මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිලි 11 ක් යොදා ගැනීම
  - සංචරණ සීමා කිරීම් නිසා ඉදිකිරීම් කාර්යයන්හි සිදු වූ ප්‍රමාදයන්
  - වර්ෂය තුල, රාජ්‍ය වියදම් සමාලෝචනයට අදාළව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදී ඇති තීරණයට අනුගත වෙමින් ටොරින්ටන්, මාලිගාපිටිය හා පාසල් පහක කෘතිම ධාවන පථ ඉදිකිරීම හා එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන (Crossfit Gym) ඉදිකිරීම තාවකාලිකව නතර කිරීමට සිදු වීම.

2.1.3 ඉහත අභියෝග ජයගැනීමට ගත් ක්‍රියාමාර්ග

- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා සංවර්ධනයට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීම
- පවතින තත්වය තුළ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හඳුනාගෙන ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීම
- කුඩා ව්‍යවසායකයන් සඳහා අලෙවිකරණ ක්‍රමවේද හඳුන්වා දීම (මාර්ගගත ක්‍රමවේද) හා මූල්‍ය පහසුකම් අවස්ථා ඇති කිරීම

- මාර්ගගත ක්‍රමයන්ට (online systems) ප්‍රවේශ වීමේ අවස්ථා හා පහසුකම් ඉහළ නැංවීම
- ඉගෙණුම් කළමනාකරණ පද්ධති (LMS) ස්ථාපිත කිරීම,
- වඩාත් ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් ක්‍රීඩා පුහුණුවීම් හා ශාරීරික ක්‍රියාකාරකම් සිදු කිරීම

2.1.4 සංවර්ධන ව්‍යාපෘති / වැඩසටහන් වල ප්‍රගතිය

වැඩසටහනේ නම	වෙන්කළ ප්‍රතිපාදන - 2021 (රු.මි.)	2021 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය	763.00	323.00	23.10	7%	43%
දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා ඇකඩමිය	850.00	305.00	180.00	59%	40%
ක්‍රීඩා පාසල් වල යටිතල පහසුකම් සංවර්ධනය (දුණු හා වෙඩි පිටි)	145.00	100.00	2.30	2%	40%
ටොරින්ටන් ක්‍රීඩා පිටියේ මීටර් 400ක කෘතිම ධාවන පථය ඉදිකිරීම*	500.00	150.00	-	0%	0%
කුරුණෑගල මාලිගාපිටියේ මීටර් 400ක කෘතිම ධාවන පථය ඉදිකිරීම*	500.00	150.00	37.59**	25%	0%
එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන (crossfit gym) ඉදිකිරීම*	500.00	0.00	0.00	0%	0%
ග්‍රාමීය ක්‍රීඩා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධන**	500.00	500.00	436.49	87%	99%
එකතුව	**3,758.00**	**1,528.00**	**679.48**	**44%**	

* ටොරින්ටන් හා කුරුණෑගල මාලිගාපිටියේ ක්‍රීඩා පිටියේ මීටර් 400ක කෘතිම ධාවන පථය ඉදිකිරීම හා එළිමහන්

** මෙම ව්‍යාපෘතිය ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රජය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වේ.

කායවර්ධන මධ්‍යස්ථානය (crossfit gym) ඉදිකිරීම වර්ෂය තුල, මූල්‍ය සංශෝධන/සීමාවන් වලට අනුගත වෙමින් තාවකාලිකව නතර කරන ලදී.

ජාතික ක්‍රීඩා අරමුදල

ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ධෛර්ය දීම, ක්‍රීඩාව දියුණු කිරීම, සංවර්ධනය කිරීම සඳහා ආධාර හා අනුබල දීමේ අරමුණින් 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ විධි විධාන අනුව ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවා ඇත.ජාතික ක්‍රීඩා අරමුදලින් ජාතික තලයේ සංවිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මාසික පෝෂණ දීමනා ගෙවීම්, ජාත්‍යන්තර ජයග්‍රහණ වෙනුවෙන් සිදු කරන ත්‍යාග ලබාදීම්, ක්‍රීඩා සංගම් හා සම්මේලන සඳහා මුදල් ලබාදීම් හා ක්‍රීඩා තරඟ සඳහා මුදල් ලබාදීම් සිදු කරනු ලබයි. ජාතික ක්‍රීඩා අරමුදල සඳහා අරමුදල් ලැබෙන ප්‍රධානතම මූල්‍ය ප්‍රභව වනුයේ භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන සහ ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් ලබන වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදනයි.

විදේශීය රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය විවිධ රටවල් සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම් සම්බන්ධ ප්‍රගතිය සලකා බැලීමේදී 2021.12.31 දින වන විට, ක්‍රීඩා අංශයේ, රටවල් 13ක් සමඟ අවබෝධතා ගිවිසුම් 13ක් සහ තරුණ අංශය හා සම්බන්ධව රටවල් 11ක් සමඟ අවබෝධතා ගිවිසුම් 11ක් සඳහා අත්සන් කර ඇත.







2.2 ඉදිරි දැක්ම

2.2.1 අපේක්ෂිත ප්‍රධාන ඉලක්ක 2022 - 2026

- ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් තරුණ විරැකියාව 12% දක්වා පහත හෙළීම
  - දළ ජාතික නිෂ්පාදිතයට ක්‍රීඩා ආර්ථිකයේ දායකත්වය ඇ.ඩො.මිලියන 1000ක් (GDP 1%)
- ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබා ගත හැකි ක්‍රීඩා තරග සඳහා සහභාගීත්වය 25% කින් හා ඔලිම්පික් හා පොදු රාජ්‍ය මණ්ඩලීය පදක්කම් සංඛ්‍යාව 20 දක්වා වැඩි කිරීම
- නිරෝගිමත් ජන සමාජයක් උදෙසා සෑම පුරවැසියෙක්ම ශාරීරික ක්‍රියාකාරකමකට හෝ ක්‍රීඩාවකට යොමු කිරීම

2.2.2 තරුණ හා ක්‍රීඩා සංවර්ධනයට උපාය මාර්ගික ප්‍රවේශය (2022 - 2026)

- ආයතනික ප්‍රවේශය
  - සියළු ආයතන අතර ඒකාබද්ධ ප්‍රවේශයක් සිදු වන පරිදි 2022 වර්ෂයේ සිට අයවැය ප්‍රතිව්‍යුහගතකරණය
  - ආයතනික කාර්යයන් හා සේවාලාභීන්ට සේවා ලබා දීම කාර්යක්ෂම කිරීම සඳහා පොදු ඩිජිටල් ක්‍රමවේද හඳුන්වා දීම
  - ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය

- ක්‍රීඩා අංශය
  - ක්‍රීඩා දක්ෂතා සංවර්ධනයට (Talent Development) වෙන් කෙරෙන ප්‍රාග්ධන ප්‍රතිපාදනවල ප්‍රතිශතය 40% දක්වා ක්‍රමිකව වැඩි කිරීම.
  - ක්‍රීඩාවේ දක්ෂතා සංවර්ධනය සඳහා ක්‍රීඩකයන් 5000 ඉලක්ක කර ගැනීම.
  - රට පුරා ව්‍යාප්ත වන පරිදි ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා යටිතල පහසුකම් වර්ධනය කිරීම

- තරුණ අංශය
  - Hope for Youth "යෞවනයේ බලාපොරොත්තුව" ජාතික තරුණ වැඩසටහන දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම
  - දැනට සිටින කුඩා පරිමාණ ව්‍යවසායකයින් අතුරින් 150,000 ක් සංවර්ධනය කිරීම හා නව ව්‍යවසායකින් 20,000 ක් බිහි කිරීම
  - ජාතික තරුණ අරමුදලක් ස්ථාපිත කර තරුණ ව්‍යවසායකයන්ට අවශ්‍ය ආයෝජන ලබා දීම සඳහා සරල ණය ක්‍රමයක් හඳුන්වා දීම
  - දේශීය හා විදේශීය කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි තරුණ ප්‍රජාවගේ ජීවන කුසලතා වර්ධනය සඳහා කටයුතු කිරීම
  - රාජ්‍ය අංශයේ පෞද්ගලික අංශයේ හෝ විදේශ රැකියා අවස්ථාවන් හදුනා ගැනීම සඳහා තරුණ මානව දත්ත බැංකුවක් ස්ථාපිත කිරීම

ආයතන ප්‍රධානියාගේ අත්සන

අනුරාධ විජේකෝන්
ලේකම්
තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
නො. 09, පිලිප් ගුණවර්ධන ...
මාවත

2021.12.31 දිනට මූල්‍ය ප්‍රකාශය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 ප්‍රතිශෝධිත රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2,020 රු.	ඒසීඒ-එෆ්
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ - 1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,392,141,000	1,528,285,811	ඒසීඒ - 3
-	තැන්පතු		7,584,476	116,231,294	ඒසීඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		26,025,477	98,879,457	ඒසීඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**1,425,750,954**	**1,743,396,562**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) මී (ආ)		**1,425,750,954**	**1,743,396,562**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	297,179,189	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)		**1,425,750,954**	**1,446,217,373**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
795,423,000	වැටුප්,වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	741,405,153	484,630,697	
337,583,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	155,474,845	187,409,484	ඒසීඒ - 2 (II)
2,458,520,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	2,024,172,200	1,940,027,110	
-	පොළී ගෙවීම්	8	-	-	
775,500	වෙනත් පුනරාවර්තන වියදම්	9	235,658	258,505	
3,592,301,500	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**2,921,287,856**	**2,612,325,796**	
	මූලධන වියදම				
53,208,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	34,414,083	41,256,479	
1,879,435,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	231,793,177	144,261,721	
2,035,800,000	ප්‍රාග්ධන මාරු කිරීම	12	850,312,537	968,420,617	ඒසීඒ - 2 (II)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	

අයවැය 2021 ප්‍රතිශෝධිත රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2,020 රු.	ඒසීඒ-එහ
17,000,000	හැකියා වර්ධනය	14	4,727,958	7,193,929	
2,560,043,500	වෙනත් මූලධන වියදම්	15	624,087,467	345,744,261	
6,545,486,500	මුළු මූලධන වියදම් (උ)		**1,745,335,221**	**1,506,877,007**	
	තැන්පතු ගෙවීම්		20,357,225	49,876,727	ඒසීඒ - 4
	අත්තිකාරම් ගෙවීම්		28,936,737	80,635,711	ඒසීඒ - 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම				
	ප්‍රධාන ලෙජර් වියදම (ඌ)		**49,293,961**	**130,512,438**	
	මුළු වියදම් ඒ = (ඊ මි උ මි ඌ)		4,715,917,038	4,249,715,241	
10,137,788,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-ඒ)		**(3,290,166,085)**	**(2,803,497,868)**	
	අග්‍රම සැසඳුම ප්‍රකාශය අනුව ශේෂය		**(3,290,166,085)**	(2,803,497,868)	ඒසීඒ - 7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ - 3
			(3,290,166,085)	**(2,803,497,868)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ - 6	2,082,071,374	2,110,854,635
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ - 5/5 (ඒ)	81,247,743	78,160,986
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ - 3	-	-
මුළු වත්කම්		**2,163,319,117**	**2,189,015,621**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(30,101,242)	(45,960,747)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,082,071,374	2,110,854,635
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ - 5 (බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ - 4	111,348,985	124,121,733
අග්‍රිම ශේෂය	ඒසීඒ - 3	-	-
මුළු වගකීම්		**2,163,319,117**	**2,189,015,621**

පිටු අංක ..... 1 සිට ..... 125 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .....126 සිට ..... 154 ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහි දී මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : අනුරාධ විජේකෝන්
තනතුර තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය
දිනය

ගණන් දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය :

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී / අධ්‍යක්ෂ (මුදල්) කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2022.02.25

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	53,926,281	38,549,030
අග්‍රිම ලැබීම්	1,392,141,000	1,825,465,000
අත්තිකාරම් අයකර ගැනීම්	26,346,677	95,145,529
තැන්පතු ලැබීම්	7,472,366	39,460,675
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,479,886,325**	**1,998,620,234**
අඩු කළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	877,370,491	1,529,019,989
සහනාධාර සහ මාරු කිරීම්	179,213,058	40,319,354
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	17,851,521	(573,800,573)
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	297,179,189
අත්තිකාරම් ගෙවීම්	30,375,173	119,465,109
තැන්පතු ගෙවීම්	20,357,225	50,075,652
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,125,167,467**	**1,462,258,720**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)	**354,718,858**	**536,361,513**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ශිෂ්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	354,718,858	536,361,513
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**354,718,858**	**536,361,513**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) - (ඉ)	(354,718,858)	(536,361,513)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) මී (ඊ)	**(0)**	**-**

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩු කළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපහු ගෙවීම්	-	-
විදේශීය ණය ආපහු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) මී (ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (රු.,000)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්ත මේන්තුව	අවසන් ඇස්ත මේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම ඇස්තමේන්තු වේ % ලෙස
2002.01.01	නිවාස කුලි	160	295	242	
2002.02.99	ණය පොළි	750	2,600	3,060	117.69
2003.02.99	වාහන භාවිතය	20	65	73	112.31
2003.03.02	දඩ මුදල්	10	5	0	0
2003.99.00	අනෙකුත්	13,500	3,300	12,162	368.54
2004.01.00	වැන්දඹු අනත්දරු			33,551	
2006.02.01	ස්ථාවර වත්කම් විකුණුම්	0		4,219	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය (රු.,000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිතිපාදන		වෙන් කරන ලද ප්‍රතිපාදන	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	3,264,535	3,592,301.5	2,921,288	27
ප්‍රාග්ධන	4,539,050	6,545,486.5	1,745,335	81

3.7 මු.රෙ. 208 ප්‍රකාරව

වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන			තත්ය ප්‍රතිපාදන (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල% ලෙස
	ප්‍රතිපාදන අරමුණ	මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
රාජ්‍ය සේවා පලාත් සභා හා පලාත් පාලන ආයතනය	වැටුප් ගෙවීමට	49,120,000	53,089,000	53,089,000	29%
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ජාතික ක්‍රීඩා සභා කාර්යාලය	5,000,000	-	5,000,000	-
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	CCTV කැමරා පද්ධතිය සැකසීම	1,604,427	-	1,604,427	100%
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අත්තිකාරම් B ගිණුම	1,105,508	-	1,067,634	96%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධන

මූල්‍ය නිබඳ ගිණුම්	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව (රු.)	ඉදිරියේදී ගිණුම් කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	526,088,747.28	627,945,649.20	-	-
9152	යන්ත්‍රෝපකරණ	792,235,812.75	504,204,728.34	-	-
9153	ඉඩම්	300	300	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	351,120	426,120	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	0	0	-	-
9160	කෙරිගෙන යන වැඩ	792,178,654.86	959,494,576.47	-	-
9180	බදු දෙන ලද වත්කම්	0	0	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්ඒඕ/ඒ/එම්එස්/2/21/01 මෙහි අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

ලේකම්
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරාමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය ඒනෙස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

2

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශ
2.4	වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.142,376 ක් වූ හා වර්ෂ 05 ඉක්මවූ එකතුව රු.162,376 ක් වූ නැන්පතුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට දක්වා ඇති ශේෂය හා 2021 ජනවාරි 01 දිනට වූ ආරම්භක ශේෂවල රු.351,952,534 කින් නොඇසැදී තිබුණු අතර ආරම්භක ශේෂයටම මූල්‍ය නොවන වත්කම් එකතු කිරීම් සහ අඩු කිරීම් සිදු කර තිබීම මෙයට හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2022 හා 2022 ජනවාරි 03 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදය අනුව සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් තම ආයතන යටතට ගැනෙන වාහන පිළිබඳව 2021 දෙසැම්බර් 31 දිනට තොරතුරු යාවත්කාලීන කල යුතු බව දක්වා තිබුණද අමාත්‍යාංශයට අයත් වාහන 16 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණු ඌව්වරණලිය ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණයේ ඉදිකිරීම් 2020 වර්ෂයේදී නවතා දමා තිබුණු අතර ඒ සඳහා 2019 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා හා ණය ලබා ගැනීමේ වියදම් රු. 53,551,631 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘතියට අදාලව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් රු.1,339,086 ක් පැවති අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.17,308,857 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණි. මෙයට අදාල වත්කම් උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූයෙන් හා භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් අගය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ඈ) ජාතික සුගතදාස ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් රු.50,000,000 ක් වූ ක්‍රීඩා හෝටලය අංක 61111 (හොටෙල් ඇන්ඩ රෙස්ටුරන්ට්) යටතේ දක්වා තිබුණු අතර ඒ අනුව එම ප්‍රමාණයෙන් අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය පිහිටි ගොඩනැගිල්ල රු.358,000,000 අගයකට ගිණුම් ගත කර තිබුණි. එම ගොඩනැගිල්ල පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරියට අයත් වුවද එය තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) අංක MOYS/ACC/A8/8/CG හා 2021 අගෝස්තු 03 දිනැති ලේකම්ගේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල් වෙත යැවූ ලිපිය පරිදි මෙම අමාත්‍යාංශයට අනුබද්ධව පවතින නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම 3කට අදාල තක්සේරු අගයන්, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන තෙක් තාමික අගයක් ලෙස CIGAS වැඩසටහනෙහි රු.300 ක් ලෙස ගිණුම්ගත කර ඇති බැවින් එම ඉඩම් වලට අදාල වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා ලබා ගැනීමෙන් පසු අදාල ඉඩම්වල නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණද 2022 මැයි 31 දින වන විටද නිවැරදි අගයන් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) අමාත්‍යාංශය යටතේ ඇති දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ජාතික ක්‍රීඩා සභාව සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යන ආයතනවල මූල්‍ය නොවන වත්කම්ද (ඉඩම් හා ගොඩනැගිලි) තක්සේරු කල යුතු බව ප්‍රධාන ගණකාධිකාරිගේ අංක MOYS/ACC/A8/8/CG හා 2021 ජූනි 17 හා 2021 ජූලි 02 දිනැති ලිපි මඟින් අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන) වෙත දන්වා තිබුණද විගණන දින වන විටද එලෙස කටයුතු නොකිරීම හේතුවෙන් ගිණුම් ගත කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

1.6.1 2 කුලී වැඩ හා අත්තිකාරම් ගිණුම

අංක 250/2016 (i) හා 2016 අගෝස්තු මස 03 දිනැති රජයේ ගිණුම් වක්‍රලේඛයේ 05 හා 06 ඡේද පරිදි අත්තිකාරම් සම්බන්ධයන් රජය සතු හිමිකම ජනරජ ගිණුමෙන් පෙන්නුම් කරන බැවින් ඒ සඳහා වන කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා කුලී හා වැඩ අත්තිකාරම් සංවිත ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ඒසීඒ 5 (ඒ) ආකෘතිය හා 5 (බී) ආකෘති මඟින් දැක්විය යුතු වුවද, ව්‍යාපෘති 03 ක් සඳහා ගෙවා තිබුණු රු. 90,387,504 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.24,978,383 ක් අත්තිකාරම් ගිණුමේ දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.2 ඡේදයෙහි වාර්තාකරණ ආයතනය විසින්, වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙතුවෙන් එකතු කරනු ලබන ආදායම, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංඝන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් අමාත්‍යාංශය විසින් එකතු කරන ලද ආදායම් ලෙස රු.53,926,281 ක් දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංඝන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු.6,545,486,500 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු.1,745,335,221 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.4,800,151,279 ක් හෙවත් සියයට 73 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 18 ක එකතුව රු. 1,073,050,078 ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා නිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.11,280,304 ක් වූ ඉතිරිවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට දක්වා පරාසය 99 පැවැතුණි.

2.3 බැරකම් හා බැඳීම්වල ඵලඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය මුදල් වක්‍රලේඛ අංක කාශන පිළියෙල කිරීමේ ප්‍රඡේදය යටතේ මූල්‍ය 10.1 හි 2020/02 මාර්ගෝපදේශ අංක ඡේදය අනුව සටහන් අංක 3.4 හි 06(iii) යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාළව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමග සැසඳී නිබිය යුතු වුවද සටහන අංක iii යටතේ වූ බැඳීම් හා බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ බැඳීම් හා බැරකම් ප්‍රකාශය අතර වැය විෂයයන් 06කට අදාලව රු1.80,920ක් වැඩියෙන් හා විෂයයන් 4 කට අදාළව 9රු8.54,967ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනය සමග ඉදිරිපත් කර තිබුණු බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.2,180,969 ක් වූ බැරකම්, බැරකම් නිදහස් කිරීම් යටතේ දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම වලක්වාලීමේ අරමුණ ඇතිව වක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී තිබුණද වැය විෂයයන් 05 ට අදාලව රු. 439,035 ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතිකරගෙන තිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපරිම හර ශේෂ සීමාවේ ඇස්තමේන්තු අගය රු.164,100,000 ක් වුවද ,තත්‍ය අගය රු.81,247,743 ක් වූයෙන් එය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් විය.අවම ලැබීම් සීමාව සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණද හර ශේෂයන්ගේ උපරිම සීමාව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.5 තැන්පතු

(අ) මුදල් රෙගුලාසි 570 අනුව ඉඩම් ඉල්ලිම් සඳහා තැන්පතු භැර ව්‍යාපෘති අරමුදල් තැන්පතු ව්‍යාපෘතිය සම්පූර්ණ කළ දින සිට වර්ෂ 02 ක් හා අනිකුත් සියලුම තැන්පතු තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක කාල පරිච්ඡේදය තුළ හිමිකම් නොපැවොත් ඒවා ඉකුත් වූ තැන්පතු ලෙස සලකනු ලබන අතර මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු පිළිබඳව වර්ෂ අවසානයේ ලැයිස්තු පිළියෙල කර අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කළ යුතු වුවද, තැන්පත් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 06 සිට 02 දක්වා හා රු.33,629,309 ක් වූ තැන්පතු 39 ක් සම්බන්ධයෙන් 2022 මාර්තු 04 දින වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල් ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩනොතබා අවස්ථාවෝචිත පරිදි, අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතුය. නැතහොත් ආපසු ගෙවිය යුතු වුවද රු.2,217,500 ක් වූ තැන්පතු 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත 2020 වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි සංවර්ධන නිලධාරීන්ගේ හිඟ වැටුප් ලබා දීමට අදාල දීමනාව සඳහා ඒ ඒ ආයතන වෙතින් ගෙන්වා ගෙන තිබුණු මුදලින් රු.1,220,000 ක් වූ ඉතිරි මුදල් ආපසු අදාළ ආයතන වෙත යවා නොතිබුණු අතර එම මුදල් 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) කොන්දේසි කඩ කිරීම හේතුවෙන් අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණු රු.997,500 ක් වූ ආරක්ෂණ ඇප තැන්පතුවක් 2020 ජනවාරි 08 දින පොදු තැන්පතු ගිණුමට බැර කර 2022 මැයි 31 දින වන විටද පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

ගිණුම් අංක 7040742 දරන බැංකු ගිණුමට අදාලව නිකුත් කල නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.790,512 ක් වටිනා චෙක්පත් 76 ක් සම්බන්ධයෙන් මූ.රෙ.396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

(අ) ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම

